මහව ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
--------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජූනි 15 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 අගෝස්තු 15 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මහව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම් ඉදිරිපත් කිරීමේ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට පැවති රු.94,835,651 ක් වූ හිඟහිටි ප්‍රාග්ධන ආධාර ශේෂයෙන් රු.17,195,852 ක මුදලක් නිසි අනුමැතියකින් තොරව ජර්නල් අංක 46 මගින් සමුච්චිත අරමුදලට එරෙහිව කපාහැර තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට පැවති ණයහිමි ශේෂයෙන් කර්මාන්ත ණයහිමි රු.1,422,633 ක් හා පොදු සැපයුම් ණයහිමි රු.849,051 ක් වශයෙන් රු.2,271,684 ක් නිසි අනුමැතියකින් තොරව ජර්නල් අංක 44 හා 41 මගින් සමුච්චිත අරමුදලට එරෙහිව කපාහැර තිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 නොවැම්බර් බඳවාගත් සේවකයින්ට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.11,003,107 ක වැටුප් ප්‍රතිපූර්ණ වටිනාකම රු.10,775,484 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ණයගැතියන් රු.227,623 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2014 නොවැම්බර් සිට සේවයේ ස්ථිර කළ පෙර පාසැල් පාලිකාවන් 16 දෙනෙකුට අදාළව 2015 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලයට අදාළ වැටුප් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා නොතිබූ අතර එම ප්‍රමාණය ණයහිමියන් ලෙස හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වර්ෂයේ වියදම හා ණයහිමියන් රු.5,398,952 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ඉදිරි වර්ෂය වෙනුවෙන් ලද රු.321,269 ක වරිපනම් බදු ආදායම් ඉදිරියට ගෙවූ වරිපනම් ලෙස ගිණුම්ගත නොකිරීම මත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2015 ජූනි සිට ඔක්තෝබර් දක්වා වූ මාස 05 ක කාලයට අදාළව 2015 දෙසැම්බර් මස ඍජු ප්‍රේෂණ වශයෙන් ලද බැකෝ යන්ත්‍ර කුලී රු.875,000 ක මුදල මාර්ග තලන කුලී ආදායම් ලෙස ගිණුම්ගත නොකිරීම හා 2015 නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාළව ලැබිය යුතු රු.350,000 ක මාර්ග තලන කුලී ණයගැතියන් ලෙස ගිණුම්ගත නොකිරීම මත වර්ෂයේ ආදායම රු.1,225,000 ක් අඩුවෙන් හා ණයගැතියන් රු.350,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට මහව කලාපයේ හිඟ ජල ආදායම් රු.85,565 ක ශේෂය හිඟ ආදායම් ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම සහ ණයගැතියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග වශයෙන් ලද රු.26,980,000 ක යන්ත්‍ර උපකරණ හා රු.10,900,000 ක මෝටර් රථ වටිනාකම් ප්‍රාග්ධන ආදායම් හා වියදම් වශයෙන් ගිණුම්ගත නොකිරීම මත වර්ෂයේ ආදායම හා වියදම රු.37,880,000 බැගින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයට අදාළ පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලේ දායක මුදල රු.97,660 ක් වුවද, වර්ෂයේ වියදම් ලෙස රු.65,107 ක් දැක්වීම මත වර්ෂයේ වියදම රු.32,553 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.3 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 04 ක පැවති ශේෂයන් හා ඒවාට අදාල උපයෝගී ලේඛනවල පැවති ශේෂයන් අතර රු.682,003 ක නොසැසඳීම් පැවතුණි.

### 1.3.4 <u>ලැබිය යුතු ගිණුම්</u>

(i) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 72,294,745 ක් වූ අතර, එයින් තොරතුරු ඉදිරිපත් වූ රු.60,967,343 ක මුදලින් රු.64,424 ක් වසර 03 කට වැඩි ශේෂවලින් සමන්විත වී තිබුණි.

(ii) ලැබිය යුතු දෑ තුළ දීර්ඝ කාලයක සිට පවතින තොරතුරු ඉදිරිපත් නොවූ රු.6,098,770 ක අත්තිකාරම් ශේෂයක්ද 2000 වසරේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලය තුළ පවතින රු.569,208 ක පොදු අත්තිකාරම් ශේෂයක් හා වර්ෂ ගණනාවක සිට මධ්‍යම පරිසර අධිකාරිය නමින් පවතින රු.761,854 ක ශේෂයක්ද පැවතුණි.

### 1.3.5 <u>ගෙවිය යුතු ගිණුම්</u>

(i) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 72,693,577 ක් වූ අතර, තොරතුරු ඉදිරිපත් වූ රු.61,436,156 කට අදාල රු.54,857 ක් වසර 03 කට වැඩි ශේෂවලින් සමන්විත වී තිබුණි.

(ii) ගෙවිය යුතු ගිණුම් තුළ දීර්ඝ කාලයක සිට පවතින පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.3,930,686 ක ශේෂයක් පැවතුණි.

### 1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු.63,672,279 ක් වටිනාකමැති ගිණුම් විෂයයන් 03 කට අදාලව ශේෂ සැදුම්ලත් ආකාරය දැක්වෙන උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම විෂයයන් පිළිබඳ විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව අයවිය යුතු සේවක ණය ශේෂය රු.6,195,327 ක් වූ අතර එය සැසඳුම්ලත් ආකාරය පිළිබඳ උපලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි.

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,563,744 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.1,208,661 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.15,772,405 ක වර්ධනයක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.3,695,101 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.13,533,537 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රතිඵලය රු.4,725,308 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ අදාල තත්‍ය ආදායම, වියදම අදාල විචලනයන් සමඟ පහත දැක්වේ.

| | | ආදායම | | | | වියදම | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | 2015 | 2014 | විචලනය | වියදම් විෂයය | 2015 | 2014 | විචලනය |
| | | රු.000 | රු.000 | රු.000 | | රු.000 | රු.000 | රු.000 |
| (i) | උත්පාදිත ආදායම | 19,579 | 17,948 | 1,631 | පෞද්ගලික පඩිනඩි | 55,034 | 41,087 | 13,947 |
| (ii) | වෙනත් | 70,415 | 45,618 | 24,797 | | | | |
| | උප එකතුව | 89,994 | 63,566 | 26,428 | අනෙකුත් | 20,396 | 23,688 | (3,292) |
| | | | | | උප එකතුව | 75,430 | 64,775 | 10,655 |
| (iii) | ප්‍රාග්ධන ආදායම | 3,695 | 98,159 | (94,464) | ප්‍රාග්ධන වියදම | 13,534 | 90,751 | (77,217) |
| | මුළු එකතුව | 93,689 | 161,725 | (68,036) | මුළු එකතුව | 88,964 | 155,526 | 66,562 |
| | මූල්‍ය ප්‍රතිඵලය | 14,564 | (1,209) | 15,773 | අතිරික්තය | 4,725 | 6,199 | (1,474) |

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.89,994,302 න් දළ වශයෙන් සියයට 78 ක් වූ රු.70,415,640 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි ලැබීම්වලින් සමන්විත විය.එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.3,695,101 ක මුළු ප්‍රමාණයම වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල්වලින් සමන්විත විය.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.75,430,558 න් දළ වශයෙන් සියයට 73 ක් වූ රු.55,034,159 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර, ඉන් දළ වශයෙන් සියයට 96 ක් වූ රු.53,107,343 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබුණු අතර, එම වටිනාකම වැටුප් ප්‍රතිපූර්ණ යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ප්‍රාග්ධන වියදම වූ රු.13,533,537 න් සියයට 39 ක් හෙවත් රු.5,249,416 ක් සභා අරමුදලින් වැය වී තිබූ අතර ඉතිරි සියයට 61 හෙවත් රු.8,284,121 ක මුදල ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීම, පළාත් ආයෝජන වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදනවලින් සිදුකළ සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

### (අ) ඇස්තමේන්තුගත ආදායම හා තත්‍ය ආදායම

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තු ගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම පහත පරිදි විය.

| | ආදායම් විෂයය | 2015 ඇස්තමේන්තු ගත | 2015 තත්‍ය | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2014 ඇස්තමේන්තු ගත | 2014 තත්‍ය | 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 5,830 | 4,977 | 2,801 | 5,467 | 3,958 | 2,118 |
| (ii) | බදුකුලී | 8,575 | 9,809 | 333 | 7,613 | 8,436 | 338 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 771 | 503 | - | 650 | 656 | - |
| (iv) | වෙනත් ආදායම් | 79,433 | 74,705 | 14,776 | 54,504 | 50,514 | 17,339 |
| | එකතුව | 94,609 | 89,994 | 17,910 | 68,234 | 63,564 | 19,795 |

### 2.3.2 <u>බිල්කළ ආදායම හා හිඟහිටි ආදායම</u>

පහත විස්තර දැක්වේ.

| ආදායම් විෂය | | | | ආදායම් රැස් කිරීම | | | හිඟහිටි ශේෂය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2015/01/01 දිනට හිඟය | වර්ෂයේ බිල් කිරීම | එකතුව | 2015/01/01 දක්වා හිඟයෙන් | බිල්කළ ආදායමින් | එකතුව | 2015/01/01 දිනට පැවති හිඟයෙන් | බිල්කළ ආදායමින් | 2015/12/31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 2,118 | 4,977 | 7,095 | 625 | 3,669 | 4,294 | 1,493 | 1,308 | 2,801 |
| බදුකුලී | 338 | 9,809 | 10,147 | 11 | 9,803 | 9,814 | 327 | 6 | 333 |
| බලපත්‍ර ගාස්තු | - | 502 | 502 | - | 502 | 502 | - | - | - |
| වෙනත් ආදායම් | 17,339 | 74,705 | 92,044 | 25,609* | 60,691 | 86,300 | 762 | 14,014 | 14,776 |
| එකතුව | 19,795 | 89,993 | 109,788 | 26,245 | 74,665 | 100,910 | 2,582 | 15,328 | 17,910 |

* 2014 වර්ෂයේ ලද රු.9,032,000 ක මුද්දර ගාස්තු 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ලෙස ගිණුම්ගත කර නොතිබීම මත හිඟයෙන් ලැබීම් වැඩිවී තිබුණි.

### 2.3.3 <u>වරිපනම් බදු</u>

සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.2,797,993 ක් වූ අතර එය වාර්ෂික බිල් කිරීම වූ රු.2,451,538 න් සියයට 114 ක් පමණ විය. 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 32 – 42 දක්වා වූ රීති ප්‍රකාරව කාර්තු පදනම් කරගෙන හිඟ ලැයිස්තු සකස් කර අදාළ නිවේදන නිකුත් කිරීමෙන් පසු දේපළ තහනමට ගෙන හිඟ වරිපනම් බදු අය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර නොතිබුණි.

### 2.3.4 <u>බදුකුලී</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ බදුකුලී ශේෂය රු.289,926 ක් වූ අතර ඉන් රු.284,481 ක්ම 2013 වර්ෂයට පෙර සිට පවතින ශේෂයන් වන අතර අදාළ ශේෂයන් අයකර ගැනීම සඳහා සභාව විසින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) දීර්සකාලීන බදුදීම් සම්බන්ධව අයවිය යුතු රු.42,918 ක් වර්ෂ 05 ට වඩා පැරණි හිඟයන් වූ අතර එම හිඟයන් අයකර ගැනීමටද නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.3.5 <u>බලපත්‍ර ගාස්තු</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී බලපත්‍ර ලබාගත යුතු ආයතන පිළිබඳ සමීක්ෂණයක් පවත්වා එම ආයතන හඳුනාගෙන ලේඛනගත කර නොතිබුණි. මේ හේතුවෙන් 2014 වර්ෂයේ සමීක්ෂණය සිදුකර රු.250,065 ක් වූ වෙළඳ බලපත්‍ර ආදායමක් ලබා ගත්තත් 2015 වර්ෂයේ එය රු. 206,550 ක් දක්වා රු.43,515 කින් අඩු වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේදී සංචාරක මණ්ඩල පනත යටතේ ලියාපදිංචි හෝටල්වල මුළු පිරිවැටුමෙන් සියයට එකක් අය කිරීමට අතුරු ව්‍යවස්ථා පනවා තිබුණත් එම සියයට එකක බද්ද අය කිරීමේදී එම ව්‍යාපාරවල මුළු පිරිවැටුම තහවුරු කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශන හෝ කිසිදු තහවුරුවක් ලබාගෙන නොතිබුණි.

**2.3.6** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.2,752,375 ක් වූ අතර ලැබිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

## 3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 මන්ත්‍රී යෝජනා මත සභා අරමුදල් වැයකර මිලදීගෙන තිබූ වටිනාකම රු.78,255 ක් වූ ප්ලාස්ටික් පුටු 141 ක් සුභසාධක සමිති වෙත බෙදා නොහැර සභාව සතුව පැවතුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ සුසාන භූමිවල වැටවල් ඉදි කිරීම සඳහා රු.471,000 ක් පමණ සභා අරමුදලින් වැයකර අඩි 6 කම්බි කණු 300 ක් හා අඩි $5\frac{1}{2}$ කම්බි කණු 500 ක් 2014 දෙසැම්බර් මස මිලදීගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටද, එකම සුසාන භූමියක් සඳහාවත් වැටවල් ඉදි කිරීමට මෙම කම්බි කණු ලබාදී නොතිබුණි. අඩි 06 කම්බි කණු 195 ක් හා අඩි $5\frac{1}{2}$ කම්බි කණු 74 ක් අදාල අරමුණින් බැහැරව වෙනත් කටයුතු සඳහා යොදවා ඇති අතර වසරකට ආසන්න කාලයක් අදාල කාර්යයට නොයොදවා කම්බි කණු 531 ක් පමණ සභාවේ ගොඩගසා තිබුණි.

### 3.2 <u>අඹ පැල බෙදා දීම</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 ජනවාරි 23 "අපි වවමු රට නගමු" වැඩ සටහන යටතේ අඹ පැළ බෙදා දීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2015 අප්‍රේල් 01 දින රු.177,500 ක් ගෙවා අඹ පැළ 1250 ක් මිලට ගෙන තිබූ අතර මිලදී ගනු ලැබූ අඹ පැළ වලින් 200 ක් සභාපතිතුමාටද, පැළ 100 ක් එක් සභිකයෙකුටද අනෙක් සභිකයින් 16 දෙනාට අඹ පැළ 50 බැගින් ද වශයෙන් රු.156,200 ක් වටිනාකම වූ පැළ 1100 ක් බෙදා දී තිබුණද එලෙස බෙදා දීමේ පදනම හා එම පැළ ප්‍රාදේශීය ප්‍රතිලාභීන්ට ලබාදුන් බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) මෙම වැඩසටහන විධිමත් සැලසුමකට අනුව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් මිලදී ගනු ලැබූ අඹ පැළවලින් රු.21,300 ක් වටිනා පැළ 150 ක් ඉතිරි වී තිබූ අතර ඉන් රු.9,940 ක් වටිනා අඹ පැළ 70 ක් 2015 පෙබරවාරි මස සියෝදාගම සණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට ලබාදී තිබුණි. එලෙස ලබා දුන් අඹ පැළවලින් රු.3,408 ක් වූ පැළ 24 ක් විගණන දිනය වන විටද රෝපණය කර නොතිබුණු අතර ඉන් රු.1,562 ක් වූ පැළ 11 ක් මැරී තිබුණි. රෝපණය කළ පැළ 46 න් රු.4,260 ක් වූ පැළ 30 ක්ම දැඩි නියඟය හා නුසුදුසු භූමියක සිටුවීම හේතුවෙන් විනාශ වී තිබුණි. රු.11,360 ක් වටිනා ඉතිරි අඹ පැළ 80 ක් 2015 අප්‍රේල් 28 දින සභාවේ සේවකයින් හට බෙදා දී තිබුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 හා 2015 වර්ෂ සඳහා රු.3,147,174 ක මුදලක් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවා තිබුණද, ලබාගත් ජලය නිසි පරිදි යෙදවූයේද යන්න විගණනයේදී හඳුනාගත නොහැකි විය.

(ආ) 2015 වර්ෂය සඳහා සභාව සතු බළල්ල ඉරිදා සතිපොළ, මහව සෙනසුරාදා සතිපොළ හා නාගොල්ලාගම සිකුරාදා සතිපොළ හා අඹන්පොල සඳුදා සතිපොළ පිළිවෙලින් වාර්ෂිකව රු.386,500, රු.4,302,000, රු.1,903,400 හා රු.2,009,000 ක කුලියකට බදු දී තිබූ නමුත් බදුකරු විසින් ගාස්තු අයකළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් හෝ මඟ පෙන්වීම ඇතුළත් කර ගිවිසුම සකස් කර නොතිබුණි. තවද බදුකරු විසින් අසාමාන්‍ය ආකාරයෙන් ගාස්තු අය කරන්නේද යන්න පිළිබඳව අධීක්ෂණයක් සභාව විසින් සිදුකර නොතිබුණි.

## 3.4 අවිධිමත් ගණුදෙනු

ආයතන 04 කින් මිල ගණන් කැඳවා රු.52,500 ක් වටිනා දින පොත් 80 ක් මිලදීගෙන තිබුණු නමුත් ඒ සඳහා ටෙන්ඩර් මණ්ඩල තීරණයක් හෝ මහ සභා තීරණයක් නොතිබුණි. තවද දින පොත් මිලදීගත් බිල්පතද වවුචරය සමග ඉදිරිපත් නොවුණි.

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) **නාගොල්ලාගම මහජන පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කිරීම. අදියර III**

මහජන පුස්තකාලය ඉදි කිරීමේ III වන අදියර සඳහා කොන්ත්‍රාත්කරු සමඟ රු.975,000 ක වටිනාකමට 2015 අගෝස්තු 31 දින ගිවිසුම්ගතව තිබුණි. අවසන් ගෙවීම් වාර්තාවේ විෂයය අංක 04 හා 05 යටතේ කලර් බොන්ඩ් සින්ක් ඇලුමිනියම් වඩිම්බු, බාජ් බෝඩ් හා වැහි පිහිලි සපයා සවි කිරීම සඳහා මීටර් 77.8 ක් සඳහා රු.73,229 ක් ගෙවීම් කර තිබුණද, 2016 පෙබරවාරි 18 දින භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූයේ වැහි පිහිලි සහ වඩිම්බු එකිනෙකට හමුවන මුළු 04 න් 02 ක ඇලුමිනියම් තහඩුව කැඩී තිබුණි. එක් මුල්ලක දෙපසින් එන වැහි පිහිලි හා වඩිම්බු එකිනෙකට එකතු වී නොතිබුණු බැවින් අඟල් 05 ක පමණ අවකාශයක් ඇති වී තිබුණි. තවද අවසන් ගෙවීම් වාර්තාවේ විෂයය අංක 10 යටතේ උපදෙස් පරිදි බොරළු සපයා අත්තිවාරම හා ගොඩනැගිල්ල වටා පිරවීම හා තැලීම සඳහා රු.1,788 බැගින් ඝණ මීටර් 54.0 ක් සඳහා රු.96,552 ක් ගෙවීම් කර තිබුණද, භෞතික පරීක්ෂාවේදී ගොඩනැගිල්ල වටා පස් පිරවීම හා තැලීම සිදුකර නොතිබූ බව අනාවරණය විය.

(ආ) **වලස් වැව ගම මැද පාර මෝටර් ග්‍රේඩර් කර බොරළු දැමීම**

මූණමලේගම ප්‍රජා මණ්ඩලය විසින් ඉහත කර්මාන්තය සඳහා 2015 සැප්තැම්බර් 25 දින රු.250,000 ක කොන්ත්‍රාත් වටිනාකමකට මාස 03 ක කාලයකින් නිම කිරීමට ගිවිසුමට එළඹෙන ලදී. නමුත් ප්‍රජා මණ්ඩලයේ මූල්‍ය ශක්තිය සැලකිල්ලට නොගනිමින් ඉහත කොන්ත්‍රාත් වැඩ සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණි. 2016 පෙබරවාරි 18 විගණිත දිනය වන විට මාස 05 ක් ඉක්ම ගියද භෞතිකව ඉටුකර තිබුණේ අදාළ මාර්ගය මෝටර් ග්‍රේඩර් කිරීම පමණකි. මෝටර් ග්‍රේඩර් කිරීම කර තිබුණද ජල සම්පාදන මණ්ඩලයෙන් ජල නල එලීම සඳහා මෝටර් ග්‍රේඩර් කර තිබූ කාණු නැවත කපා ඉවත් කළ බොරළු මාර්ගය දෙපස ගොඩගසා

තිබුණි. විගණන දින වන විට කර්මාන්තයේ වැඩ නතර වී තිබුණු බැවින් ගිවිසුම්ගත ලෙස වැඩ ඉටු නොකිරීම සම්බන්ධයෙන් කාර්යය නිම කිරීමේ ඇප රාජ සන්තක කර අදාල කොන්ත්‍රාත්කරුට එරෙහිව නීත්‍යානුකූලව ක්‍රියාකර නොතිබුණි.

(ඇ) <u>අත්තිකාරම් නිරවුල් නොකිරීම</u>

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5:4:4 ප්‍රකාරව පිළිගත හැකි සුරක්ෂණයක් මත කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක උපරිමයට යටත්ව අත්තිකාරම් ලබාදිය හැකි වුවද, කිසිදු සුරක්ෂණයකින් තොරව සභාව විසින් 2014 වර්ෂය තුල කර්මාන්ත 75 ක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් හට රු.9,739,751 ක් අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණි.

කොන්ත්‍රාත්කරුවන් 10 දෙනෙකුට ලබාදී දී තිබුණු රු.1,362,910 ක අත්තිකාරම් මුදල කොන්ත්‍රාත්කරුවන් විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පියවා නොතිබුණි.

## 3.6 <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

සභාව මගින් අක්කර 02 ක භූමියක සේවකයින් 06 දෙනෙකු යොදවා දෛනිකව එකතු කරනු ලබන ටොන් 03 ක පමණ කසල කළමනාකරණය සඳහා කටයුතු යොදා තිබුණු නමුත් කසල වෙන් කරනු ලබන ස්ථානයට ආවරණයක් සකස් කර නොතිබුණි. තවද දෛනිකව එකතුවන කසල තැන්පත් කිරීමට දැනට පවතින කොන්ක්‍රීට් පුවරුව ප්‍රමාණවත් නොවූ බැවින් අදාළ ඉඩමේ අවිධිමත් ලෙස කසල ගොඩවල් රැස්කර තිබු බව 2016 පෙබරවාරි 18 දින කරන ලද භෞතික පරික්ෂාවේදී අනාවරණය විය.

## 3.7 <u>පාරිසරික ගැටළු</u>

වයඹ පළාත් ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකය මගින් ඉදිකර 2015 සැප්තැම්බර් 02 දින සභාවට පවරා දී තිබූ ජල පිරිපහදු මධ්‍යස්ථානයේ කටයුතු සභාව විසින් මාස 04 කට පසුව 2016 ජනවාරි මස ආරම්භ කර තිබුණද, එයින් ඉවතලන ජලය පරිසරයට අහිතකරව නිසි ක්‍රමවේදයකින් තොරව අසල පිහිටි වැවකට මුදාහැර තිබුණි. එමෙන්ම ජල පිරිපහදු ඒකකයේ පිරිපහදු කරන ජලය ගබඩා කිරීමට යොදාගන්නා ටැංකි සඳහා ආවරණයක්ද ඉදිකර නොතිබුණි.

## 4. <u>යහපාලනය හා ගිණුම් කටයුතුභාවය</u>

## 4.1 <u>අයවැය පාලනය</u>

සභාවේ උත්පාදිත ආදායම් යටතේ අය විෂයයන් 02 ක ඇස්තමේන්තුගත ආදායම රු.8,844,000 ක් වු අතර තථ්‍ය ආදායම රු.4,792,000 ක් විය.

## 4.2 <u>අභ්‍යන්තර විගණනය හා කළමනාකරණ කමිටු</u>

සමාලෝචිත වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටුව රැස්වී නොතිබූ අතර ස්ථාපිත කර තිබූ අභ්‍යන්තර විගණන ඒකකයෙන් ප්‍රමාණවත් විගණනයක්ද සිදුව නොතිබුණි.

## 05 <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඇ) කොන්ත්‍රාත් පාලනය